**අනාවරණ**

**TRANSPARENCY INTERNATIONAL**
the global coalition against corruption




# මුදලට යටවූනු ක්‍රීඩාව

## දූෂණය සහ ක්‍රීඩා ක්ෂේත්‍රය

මුදල්, තරගකාරීත්වය හෝ බලය ඇති හැමතැනකම දූෂණය නිරන්තරයෙන්ම තර්ජනයක්ව පවතී. ක්‍රීඩා ක්ෂේත්‍රයද මෙම තත්ත්වයට ගොදුරු වී ඇත. අල්ලසට එක් කණ්ඩායමකට වාසිවන පරිදි තරග මෙහෙයවීමේ සිට ක්‍රීඩාංගන ඉදිකිරීමෙන් අතමිටට මුදල් ලබාගැනීම දක්වා ක්‍රීඩා ක්ෂේත්‍රයේ පවත්නා විවිධාකාර දූෂණ හේතුවෙන් මෙම ක්ෂේත්‍රය මහත් අපකීර්තියට ලක්ව ඇත. ක්‍රීඩාවෙන් අගනා උදහරන සහ ගරුත්වය සපයමින් මූලික ආචාරශීලී මූල ධර්ම මත පදනම්වූ ජීවිත ප්‍රතිපදාවක් ඇති කෙරෙන බව ඔලිම්පික් ප්‍රඥප්තියේ සඳහන් වුවත් ක්‍රීඩාව සහ දූෂණය පිළිබඳ ගැටළුව නිරාකරණය කිරීම සඳහා බොහෝ ක්‍රීඩා සංවිධාන මෙතෙක් කිසිදු පියවරක් ගෙන නැත. ක්‍රීඩාවට සම්බන්ධ නිලධාරීන්, දේශපාලනඥයින්, ව්‍යාපාරික ප්‍රජාව, අනුග්‍රාහකයින් සහ මාධ්‍යය අතර පවත්නා කිට්ටු සම්බන්ධතාවය හේතුවෙන් දූෂණය සඳහා වටපිටාව මනාව සකස්කර ගත හැක. එමෙන්ම විනිවිදභාවය සහ වගවීම අතින් ක්‍රීඩාව ඇත්තේ පහත් මට්ටමකය. මේ තත්ත්වය වෙනස් නොකොට දූෂණයට තුඩුදෙන මං අසුරා ක්‍රීඩාවේ සුපිළිපන්නතාව ගොඩනැගීම උගහටය.

**අන්තර්ගතය**


**1 සංකල්පයන් හඳුන්වාදීම**

**2 දූෂණය හා දරිද්‍රතාවයේ අන්තර් සබඳතාව අවබෝධ කරගැනීම**

**3 චක්‍රය වෙන්කිරීම**

**4 මීළඟ පියවර අනුගමනය කිරීම**

## 1 ජයග්‍රාහකයින් සහ පරාජිතයින්

ක්‍රීඩාව සමාජයට මහත් බලපෑම් කළ හැකි බිලියන කෝටි ගණනක් වටිනා ව්‍යාපාරයකි. ලෝකය පුරා කෝටි ගණන් ජනයා ඔලිම්පික් තරග හෝ පාපන්දු ලෝක කුසලානය වැනි ක්‍රීඩා නරඹති. ඒ ඒ රටවල ජනයා තමන් කැමති ක්‍රීඩා වලට සහභාගිවෙති. තරග නරඹති. මාධ්‍ය හරහා දැක බලා ආස්වාදයක් ලබති. මෙවන් පුළුල් සහභාගිත්වයක් රටක දේශපාලනය, ආර්ථිකය සහ සංස්කෘතියට බෙහෙවින් බලපායි. ක්‍රීඩාවෙන් තරුණයින්ට, සෞඛ්‍යයට, එදිනෙද ජීවිතයට සහ ජාතික අනන්‍යතාවයට අවධානය යොමුවෙයි.

රූපවාහිනී ප්‍රචාරක අයිතිය, අනුග්‍රාහකත්වය සහ යටිතල ව්‍යපෘති ක්‍රීඩාව වාසිදායක ව්‍යාපාරයකට හරවා ඇත. උදාහරණයක් ගෙන බලමු. චීනයේ බේජිං නුවර 2008 වසරේ පැවැත්වූ ඔලිම්පික් තරගමාලාවේ රූපවාහිණී අයිතිය අලෙවි කිරීමෙන් අන්තර්ජාතින ඔලිම්පික කමිටුව ලැබූ ආදායම අමෙරිකන් ඩොලර් බිලියන 1.7 කි. යුරෝපීය සංගමයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් ක්‍රීඩාවට හිමිවන ප්‍රමාණය සියයට 3,65 ක් බව ගණන්බලා ඇත. ක්‍රීඩාව හා සම්බන්ධ රැකියා ප්‍රමාණය මිලියන 15 කි. එය යුරෝපීය සංගමයේ මුලු සේවක ප්‍රමාණයෙන් සියයට පහකි. යුරෝපීය සංගමයට අයත් රටවලට පැමිණ හෝටල් වල නවාතැන් ගන්නා සංචාරකයින්ගෙන් සියයට 25 ක් ක්‍රීඩාව හා සම්බන්ධ කටයුතු සඳහා පැමිණෙන්නන්ය. යුක්රේන් වැනි රටක් රජයේ ඇය වැය ලේඛනයෙන් සියයට දෙකක් පමණ ක්‍රීඩාව සඳහා වෙන්කරයි. ෆින්ලන්තයේ ජාතික ලොතරැයිය මගින් අවුරුදු පතා යුරෝපා ඩොලර් මිලියන සියයක් ක්‍රීඩාවට ලබාදෙයි.

කෙසේවුවද, කළමනාකාරිත්වය අතින් දුර්වල, මනා සංවිධානයක් නොමැති, මූල්‍යමය සහ අලෙවි කටයුතු අතින් නිපුනත්වයක් නොමැති රටවල ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුපිලිපන්භාවයට හානි කෙරෙන අයුතු අන්දමින් එල ප්‍රයෝජන ලබාගත හැකි වාතාවරණයකට ඉඩකඩ සැලසේ. එසේම, ඒවායේ සංවිධානාත්මක ව්‍යුහයන් සකස්වී ඇති ආකාරය අනුව විනිවිදභාවය සහ වගවීමට ඉඩ ඇහිරී ඇත. බොහෝවිට, කළින් ක්‍රීඩා ශූරයින් හෝ ක්‍රීඩා සමාජ වල නායකත්වය දැරූ පුද්ගලයින්ට අධික වගකීම්, බලතල සහ මුදල් ලබාදී ඇත.

සුපිළිපන්භාවය නැතිකම හේතුවෙන් ක්‍රීඩාවේ උන්නතියට අත්‍යාවශ්‍ය අගයන් වන සාධාරණත්වය, ආචාර ධර්ම, අන්‍යෝන්‍ය ගරුත්වය සහ විශ්වාසය නැතිවී යෑමට පුළුවන. ක්‍රීඩාවෙන් බලාපොරොත්තු වන උසස් ආචාර ධර්ම සහ ගුණයන් දිගින් දිගටම පවත්වාගෙන යෑමට නම් ක්‍රීඩකයින්ගේත්, ක්‍රීඩා සංවිධානවලත්, මුළු ක්‍රීඩා ක්ෂේත්‍රයේත් සුපිළිපන්භාවය ආරක්ෂාකරගැනීමත් ප්‍රචලිත කිරීමත් වැදගත්ය. එය කල් නොයවා කළයුත්තකි. විෂමාචාර බෙහෙවින් සිදුවන,  විනිවිදභාවය බෙහෙවින් අඩු අංශ ඉලක්ක කර නව රෙගුලාසි පැනවීම සහ ප්‍රතිසංවිධාන ඇති කළ යුතුය. මෙම ගැටළු බෙහෙවින්ම ඇත්තේ තරග අනිසි ලෙස මෙහෙයවීම, සංවිධානාත්මක අපරාධ, යහ පාලනය, මාරුකිරීම්, ඉදිකිරීම්, අනුග්‍රහය සහ මාධ්‍යය සම්බන්ධයෙනි.

### තරග පාවාදීම

මෙය ක්‍රීඩා බොහොමයක් විවිධ මට්ටම්වලින් මුහුණපාන ගැටළුවකි. සාමාන්‍යයෙන් ජාතික, ක්‍රීඩා සමාජ මෙන්ම පෞද්ගලික මට්ටමින් අභිමානය සහ කීර්තිය උදෙසා තමන්ට ලැබී ඇති අවස්ථාවන් ගිලිහීයෑමට ඉඩ නොදීමට පෙළඹේ. නමුත් මුදලට එසේ නොකරන අවස්ථාද ඇත. උදාහරණයක් ගෙන බලමු. තරග වාරයක් අවසන්වීමට ළංවෙත්ම ලකුණු පුවරුවේ තමන් සතු ස්ථානය ඉහළ පහළ යන කණ්ඩායමකට, තරගයකින් පරාජයවීමට තවත් කණ්ඩායමක් පෙළඹවීමට පුලුවන.

තුරඟ තරග සිට ටෙනිස් ක්‍රීඩාව දක්වා වැඩියෙන්ම පෙළඹවීම් වලට ගොදුරුවන්නේ සිය පෞද්ගලික වාසිය තකා අයුතු ප්‍රයෝජන ගන්නා තීරකවරුන්, විනිසුරුවන්,පුහුණුකරුවන් සහ තරගකරුවන්ය. 2007 වසරේදී පැවැත්වුණු යුරෝපීය අත්පන්දු ශූරතා තරගමාලාවේදී ඇතිවූ පෙළඹවීම් පිළිබඳව අනාවරණය වූයේ 2009 මාර්තු මාසයේදීය. ඊට පෙරාතුව ජර්මන් ජාතික තීරකවරුන් දෙදෙනෙක් රුසියාවේ පැවති ජාත්‍යන්තර තරගයකින් පසු අමෙරිකන් ඩොලර් පනස් දහසක් සිය බෑග වල සඟවා ගෙනැවිත් තිබුණි. එතරම් මුදල් ප්‍රමාණයක් තමන්ට කෙසේ ලැබුණේදැයි පැහැදිලි කිරීමට ඔවුන්ට බැරිවිය.

### යුරෝ 2012: නිදසුනක්

වසර 2012 දී 'යුරෝ 2012' නමින් හැඳින්වෙන යුරෝපීය පාපන්දු ශූරතාවේ ආගන්තුක රටවල් දෙක වන්නේ පෝලන්තය සහ යුක්රේනයයි. යුරෝපයේ පාපන්දු ක්‍රීඩාවේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස මෙම ශූරතාව පිළිගැනේ. මේ දෙරටේ පාපන්දු සම්මේලනවලට විරුද්ධව එල්ලවී ඇති දූෂණ චෝදනා වලට එරෙහිව නැගී සිටීමට මෙය කදිම අවස්ථාවකි. පාපන්දු ක්‍රීඩාවේ සුපිළිපන්බව මනාව ගෙනහැර පෑමට දෙරටටම අවස්ථාවක් සැලසී ඇත.

විනිවිදභාවය සහ වගවීම අතින් දෙරටම දුර්වලය. මේ හේතුවෙන් අයථා ක්‍රියාවන්ට බෙහෙවින් ඉඩකඩ ඇත. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ වාර්ෂික දූෂණ දර්ශකයේ 2008 සංඛ්‍යා අනුව රටවල් 180 ක් අතර යුක්රේනය සිටින්නේ ඉතාමත් පහළ මට්ටමකය. පෝලන්තය ඊට වඩා හොඳ තත්ත්වයක සිටී. කෙසේවුවද පෝලන්තයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ අනිසි ක්‍රියාවන් සිදුවීමට ඉඩකඩ ඇති බව මෑතදී සිදුවූ යම් යම් සිද්ධීන්ගෙන් පෙනීයයි. මාධ්‍යයේ පළවූ තොරතුරු අනුව පසුගිය සිවු වසර තුළ එරට පවත්වන ලද පළමු සහ දෙවෙනි පෙළේ පාපන්දු තරග මාලාවන් වංචාවන්ගෙන් පිරී තිබුණි.

පෝලන්තයේ පාපන්දු ක්ෂේත්‍රය පුරා පැතිරී පවතින බව කියන අල්ලස්, දූෂණ මෙන්ම තරග පාවාදීම් නතරකිරීමට ගතයුතු පියවර සම්බන්ධයෙන් යුරෝපීය පාපන්දු සංගම් එකතුවත් පෝලන්ත රජයත් විමසිල්ලෙන් සිටී. එක් පියවරක් වශයෙන් පෝලන්ත රජය විසින් ජාතික පාපන්දු සංගමයේ සභාපති වරයාට ඉල්ලා අස්වන ලෙස 2008 ඔක්තෝබර් මාසයේදී බලකර සිටීමන් පසු පාපන්දු සංගම් එකතුව පෝලන්ත ජාතික පාපන්දු කණ්ඩායම තහනම් කිරීමට තර්ජනය කෙළේය.

මෙවන් සිද්ධීන්ගෙන් පෙනීයන්නේ ක්‍රීඩා සංවිධාන වල සුපිළිපන් බවත් යහ පාලනයත් පවත්වාගෙන යද්දී ස්වයං පාලනයට ඇති අසීරුතාවයි.

**තරග පාවාදීම ඒ ඒ කණ්ඩායම් වලට ලැබෙන ස්ථානය සඳහා පමණක් නොව ලොව පුරා අමෙරිකන් ඩොලර් බිලියන 290 ක් වටිනා ඔට්ටු අල්ලීමේ දැවැන්ත කර්මාන්තයකටද බලපායි. බොක්සිං සහ අමෙරිකන් පාපන්දු ක්‍රීඩාවන් සිට අයිස් හොකී සහ ක්‍රිකට් ක්‍රීඩාවන් දක්වා සෑම ක්‍රීඩාවකටම ඔට්ටු අල්ලනු ලැබේ. අමෙරිකාවේ නෙවාඩා ප්‍රාන්තයේ පමණක් වසරක් පාසා තුරඟ තරග සහ ක්‍රීඩාවලට ඔට්ටු ඇල්ලීමේ කර්මාන්තයේ වටිනාකම ඩොලර් බිලියන 3 කි.**

**ඩෙන්මාර්කයේ පාපන්දු සංගමය ක්‍රීඩකයින් ලබාගන්නා අල්ලස් පිළිබඳව සමීක්ෂණයක් පැවැත්වුවද එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් නොකෙරුණි. අනිසි අයුරු වාසි ලබාගත් සමාජ ගැන සමීක්ෂණයට හවුල්වූ සියයට 11 ක් දැනසිටි අතර සියයට 29 ක් කියාසිටියේ තරග පාවාදීම දිගින් දිගටම වැඩිවන බවයි.**

**වාර්තාව ලබාගත් මාධ්‍යවේදියෙක් එය පළකල විට ඩෙන්මාර්ක පාපන්දු සංගමය කිවේ එම වාර්තාව ගැන මහජනයාට ඇති උනන්දුව කුමක්ද යන්නයි.**

එම තරගයට කලින් තමන්ට එවන් අනිසි යෝජනාවක් කෙරුණු බව මෙන්ම රුසියානු රේගුවේදී ඇතිවූ සිද්ධිය නොදැන්වීම හේතුවෙන් තීරකයින් දෙදෙනා යුරොපීය අත්පන්දු සම්මේලනය විසින් පස් අවුරුදු තහනමකට භාජනය කරනු ලැබූහ. 2005 වසරේ පෝලන්තයේ ජාතික පාපන්දු තරගමාලාවේදී අල්ලස් චෝදනා එල්ලවූ ඉහළ පෙළේ තීරකයකු සහ සහායකයකු 2009 ජූලි මාසයේදී පෝලන්ත පොලීසිය විසින් සිරභාරයට ගනු ලැබූහ. එම තරගමාලාවේදී චෝදනා ලැබූ මුළු ගණන 230 කි.

ට්‍රාන්ස්පේරන්සි ආයතනයේ දූෂණ දර්ශකය අනුව අඩුවෙන් දූෂණය පවත්නා රටවල පවා ක්‍රීඩා කණ්ඩායම් සහ ක්‍රීඩකයින් විවිධ අනිසි ක්‍රියාවන් පිළිබඳව චෝදනා ලැබ සිටින බව මෙම සිද්ධීන්ගෙන් පෙනීයයි. 2005 දී ජර්මනියේ ජාතික පාපන්දු තරග තීරකයකු වන රොබට් හොයිසර්, ඔට්ටු දැමීම සහ තරග වංචා වලට තීරකයින් යොදගැනීම අතර පවත්නා සම්බන්ධකම් අනාවරණය කෙළේය. ඒ වසරේදීම බ්‍රසීලය, චෙක් සමූහාණ්ඩුව, ඉතාලිය, ස්ලොවාකියාව සහ තුර්කිය යන රටවල තීරකයින්, ක්‍රීඩකයින් සහ පුහුණුකරුවන් ගණනාවක් අනිසි ක්‍රියාවන් පිළිබඳව වරදකරුවන් ලෙස නිගමනය කෙරුණි. තවත් රටවල් නවයක එවන් චෝදනා පිළිබඳව පොලීසිය පරීක්ෂණ පැවැත්විය.

තරග පාවාදීම පිළිබඳව අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයන් ගැන යුරෝපීය සංගමය සහ වෙනත් අන්තර්ජාතික සංවිධාන මෙන්ම ලෝක පාපන්දු සම්මේලනය, ජාත්‍යන්තර ටෙනිස් සම්මේලනය, ජාත්‍යන්තර ක්‍රිකට් මණ්ඩලය සහ යුරෝපීය පාපන්දු සංගම් වැනි අන්තර්ජාතික ක්‍රීඩා සංගම් ක්‍රියාකරමින් සිටිති. ඒ සංගම් ඔට්ටු ඇල්ලීම හා සම්බන්ධ සංවිධාන සමග ද කිට්ටුවෙන් කටයුතු කරති. ක්‍රීඩාවේ සුපිළිපන්බව ප්‍රචලිත කිරීමට අවශ්‍ය යැයි පිලිගන්නා ජාතික ක්‍රීඩා සංගම් ඇත්තේ සුලු ප්‍රමාණයක් පමණි. මේ අතර චෝදනා සහ නඩු දිගටම පැවැත්වේ.

## සංවිධානාත්මක අපරාධ

ක්‍රීඩාවේ ගරුත්වය විනාශ කරන ඔට්ටු ඇල්ලීමේ අපචාරය පසුපස බොහෝවිට ඇත්තේ සංවිධානාත්මක අපරාධයි. මුදල් වංචා සඳහා ක්‍රීඩා සමාජ හා ක්‍රීඩකයින් මිළදී ගැනීම, කීර්ති නාම අයිතිය මිලට ගැනීම, කණ්ඩායම් අනුග්‍රහය, සහ ප්‍රචාරක දැන්වීම් සඳහා පහසුකම් යොදගැනීම දැන් දැන් මතුවී ඇති තවත් ප්‍රශ්න අතර වෙයි. මේ සියල්ලක්ම සංවිධානාත්මක අපරාධ කල්ලි විසින් මුදල් වංචා සඳහා යොදගන්නා උපක්‍රමයන්ය. බැංකු වල මූල්‍ය කටයුතු වලදී සුපිළිපන්බව බිඳවැටෙන අවස්ථා ගැන සෙවිල්ලෙන් සිටින 'ෆිනෑන්ෂියල් ඇක්ෂන් ටාස්ක් ෆෝර්ස්' නමින් හැඳින්වෙන සංවිධානය විසින් විවිධ මාර්ග ඔස්සේ පාපන්දු ක්‍රීඩාව හා සම්බන්ධ මුදල් වංචා සිදුවන ආකාරය හෙළිදරව් කර ඇත. ඒවා අතර මුදල් පරිහරණය, රටවල් අතර මුදල් හුවමාරුව, බදු සහන සහ විවිධ සමාගම් නමින් කෙරෙන ගණුදෙනු ආදිය වෙති. රටවල් 25 ක පාපන්දු හා සම්බන්ධ මුදල් අක්‍රමිකතා 20 ක් මෙම සංවිධානය විසින් සොයාගෙන ඇත. මෙම ක්ෂේත්‍රයේ සංවිධානාත්මක දුර්වලකම් හේතුවෙන් ජාවාරම් කල්ලි වලට කළු සල්ලි නීත්‍යානුකූල මුදල් බවට පත්කර ගැනීමට සුදුසු වාතාවරණයක් සකස්වී ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය විශ්වාස කරයි.

## යහ පාලනය

සුපිලිපන්භාවය සහ වගවීමක් ගැන නොතැකීම හේතුවෙන් පවත්නා පාලනමය දුර්වලකම් නිසා ක්‍රීඩාවේ සිදුවන අපචාර වළක්වා ගැනීම අපහසුය. අදාල තොරතුරු සහ ලියකියවිලි ප්‍රසිද්ධියේ බෙදාහදාගැනීම අතින් බොහෝ ක්‍රීඩා සමාගම්වල සුපිලිපන්භාවය ඇත්තේ අඩු මට්ටමකය. මෙය බොහෝවිට කණ්ඩායම් අයිතිකරුවන් විසින් තොරතුරු අනාවරණය නොකිරීම නිසා සිදුවන්නකි. ක්‍රීඩා සමාගම් බොහොමයක අයිතිය පුද්ගලයින් හෝ සමාගම් සතුය. මේ හේතුවෙන් ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා සංවිධාන මගින් තීරණ ගැනීමේදී සහ ඒවායේ නිලධාරීන් තෝරා පත්කර ගැනීමේදී ගැටලු ඇතිවේ. අන්තර්ජාතික ක්‍රීඩා සම්මේලන සඳහා අධ්‍යක්ෂවරුන් සහ ඒවායේ ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් තෝරාපත්කර ගැනීම වාර්තාවන්නේ ඒකමතිකව සිදුවන අයුරිනි. විරුද්ධව ඡන්දය දෙන අයගේ නම් රැස්වීම් වාර්තාවල සඳහන් නොකෙරේ. මෙවන් ක්‍රියාවන් හේතුවෙන් නියම වගවීමක් සිදු නොවේ. ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධාන විසින් මුදල් බෙදාදෙනු ලබන්නේ කිසිදු වග විභාගයක් නොමැතිවය.

### හොඳ ප්‍රතිඵල මිළට ගැනීම

**ඕස්ට්‍රියාවේ ජාතික මලල ශූරියක් වන ලීසි එතලර් නමැත්තිය තමා තහනම් ඖෂධ ගත් බව පාපෝච්චාරණය කළාය. සිය පරීක්ෂණයේ ප්‍රතිඵල සඟවන්නැයි ඉල්ලමින් පරීක්ෂණාගාරයේ සේවකයකුට අල්ලස් දීමට තැත්කළ බවද ඇය කියා සිටියාය.**

**තවත් ඕස්ට්‍රියානු ජාතික බයිසිකල් ධාවන ශූරයෙක් ලෝක මත් ද්‍රව්‍ය විරෝධී ඒජන්සියේ අනුමැතියෙන් පවත්වාගෙන යන පරීක්ෂණාගාර වලට විරුද්ධව චෝදනා නැගීය. එසේ චෝදනා නැගුවේ එම පරීක්ෂනාගාරවල ඇතැම් විද්‍යාඥයින්ට තමාගේ හිටපු කළමනාකරු අල්ලස් දුන් බව කියමිනි.**

එයින් දූෂණයට බෙහෙවින් ඉඩකඩ සැලසේ. දේශපාලන තරගවලදී මෙන් මෙම මුදල් ද ක්‍රීඩා සංගම් වල ඡන්ද විමසීම් වලදී ඡන්ද මිලදී ගැනීමට යොදාගත හැක. උදාහරණයක් ගෙන බලමු. තියුණු තරගයක් පැවැත්වෙන ආසියානු පාපන්දු සම්මේලනයේ සභාපති තේරීමේදී බහරේන් නියෝජිතයින් ලෝක පාපන්දු සම්මේලනයේ අරමුදල් අනිසි ලෙස පාවිච්චි කළේයැයි බ්‍රිතාන්‍ය මාධ්‍යය චෝදනා කළේය.

දුර්වල පාලනය වර්තමානයේ ක්‍රීඩාවලට මුහුණපෑමට සිදුවී ඇති විශාලතම ගැටලුවක් වන තහනම් ඖෂධ ප්‍රශ්නය විසඳා ගැනීමට බලපෑමටද පුලුවන. යුරෝපා සංගමයේ රටවල් අතර පවත්වන ලද සමීක්ෂණයකට හවුල්වූවන්ගෙන් 72% ක් කියාසිටියේ තහනම් ඖෂධ ක්‍රීඩාවට ඇති බලවත්ම තර්ජනය බවයි. ඊළඟට වාණිජත්වය (55%) සහ දූෂණය (41%) යි. දූෂණයත්, කණ්ඩායම් සහ ක්‍රීඩකයින්ගේ ප්‍රමාද දෝෂත් හේතුවෙන් තහනම් ඖෂධ වලට ඉඩකඩ සැලසේ. දූෂිත ක්‍රියාවන් නිසා තහනම් ඖෂධ ලබාගැනීමට මග පෑදෙන අතර නීතිවිරෝධී ක්‍රියාවන් සඟවා ගැනීමට ද පුළුවන.

### ක්‍රීඩකයින්ගේ මාරුවීම්

කණ්ඩායම් අතර ක්‍රීඩකයින් මාරුකරගැනීම සඳහා දූෂිත ක්‍රියාවන් සහ අනිසි බලපෑම් යොදාගනු ලැබේ. ප්‍රංශ කණ්ඩායමක ක්‍රීඩකයකු ගිවිසුමද කඩකර තම සමාජයට බඳවාගැනීමට තැත්කිරීම හේතුවෙන් 2009 සැප්තැම්බර් මාසයේදී ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් එංගලන්තයේ චෙල්සී පාපන්දු සමාජයට ක්‍රීඩකයින් මාරුකරගැනීම වසරකට තහනම් කිරීම මීට කදිම නිදසුනකි.

ක්‍රීඩකයින්ගේ ඒජන්තවරන් ලෙස කටයුතු කරන පුද්ගලයින්ට බොහෝ ක්‍රීඩාවල වැදගත් තැනක් ඇත. ගාස්තුවක් අයකර ඔවුහු ක්‍රීඩකයින්ට කණ්ඩායම් සොයා දෙති. මාරුවීම් සහ රැකියා ගිවිසුම් සලසා දෙති. පුද්ගලික ලාභය උදෙසා තමන්ගේ තත්ත්වය අනිසි ලෙස යොදැනීමට ඔවුන් පෙළඹෙන අවස්ථා නැත්තේ නොවේ. ඒජන්තවරුන්ට බොහෝවිට ගෙවනු ලබන්නේ කණ්ඩායම් විනා ක්‍රීඩකයින් නොවේ. මේ හේතුවෙන් බැලූ බැල්මට විනිවිදබවින් තොර බැඳියා පිලිගැටුමක් ඇතිවන බවක් පෙනෙන්නට නැත.

ක්‍රීඩකයින් කණ්ඩායම් අතර මාරුකිරීම් සම්බන්ධයෙන් ඒජන්තවරුන්ගේ ක්‍රියාකලාපයන් මෙන්ම දූෂණය හා නීතිවිරෝධී චර්යාවන් පිළිබඳව ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය දූෂණ විරෝධී පිලිවෙතක් දියත් කිරීමට තීරණය කර ඇත්තේ එම ගණුදෙනු වලට අදාල මුදල් පිළිබඳව සොයාබැලීම පිණිසය. මෙම පිලිවෙත 2010 වන විට පාපන්දු ක්‍රීඩා කරන රටවල් 208 පුරා ක්‍රියාත්මක කර වංචාකාරී ඒජන්තවරුන් ඉවත් කිරීමටත්, නීතිවිරෝධී ගෙවීම් නතර කිරීමටත්, කලු සල්ලි ජාවාරම නවතාලීමටත් බලාපොරොත්තුවේ.

### ඉදිකිරීම්

විශාල පරිමාණයේ ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා අවශ්‍ය ක්‍රීඩාංගන ඉක්මණින් ඉදිකිරීමට සිදුවේ. ඒ සඳහා මුදල් සම්භාරයක් වැයකෙරේ. එවිට දූෂණයට ඇති ඉඩකඩ එමටය. 2010 දකුණු අප්‍රිකාවේ පැවැත්වෙන පාපන්දු ලෝක කුසලානය වෙනුවෙන් ක්‍රීඩාංගන ඉදිකිරීමේදී සිදුවී ඇතැයි කියන දූෂණ පිළිබඳව චෝදනා එල්ලවී ඇත. ක්‍රීඩා සඳහා රටේ අයවැය පාපන්දු කුසලානය හේතුවෙන් සිවු ගුණයක් වැඩිවී ඇත. එක් ක්‍රීඩාංගනයක් ඉදිකිරීමේදී සිදුවන දූෂණය ගැන නිලධාරීන්ට දැන්වූ පුද්ගලයකු 2009 දී මරාදමන ලදී.

‘යුරෝ 2012’ ක්‍රීඩා පැවැත්වීම සඳහා ඉදිරිපත්වන යුක්රේන්හි එක් නගරයක අලුතින් ඉදිකෙරෙන ක්‍රීඩාංගනයක් සඳහා ටෙන්ඩරය දිනූ ඕස්ට්‍රියානු සමාගමක් මුලින් එකඟවූ මුදලට වඩා 40% ක් වැඩියෙන් වියදම්වනු ඇතැයි දැන්වීමෙන් මතුවී ඇති අර්බුදයක් හේතුවෙන් ටෙන්ඩර් ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර ඇත. 2014 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වෙන රුසියාවේ සෝචි හි ක්‍රීඩාංගන ඉදිකිරීම සඳහා නීතිවිරෝධී අයුරින් ටෙන්ඩර් දිනාගැනීමට උන්නදුවීම හේතුවෙන් අර්බුදකාරී තත්ත්වයක් පැනනැගී ඇත.

## ප්‍රචාරක අයිතියට අල්ලස්

**තරග ප්‍රචාරය කිරීමේ අයිතිය ලබාගැනීම සඳහා ක්‍රීඩා සම්මේලන කිපයකම නිළධාරීන්ට 1989 සහ 2001 වසර වලදී 'ඉන්ටනැෂනල් ස්පෝට් ඇන්ඩ් ලෙෂර්' කම්පනි' නමැති සමාගම විසින් අමෙරිකන් ඩොලර් මිලියන 135ක් ගෙවූ බව ස්විට්සර්ලන්තයේ උසාවියකදී අනාවරණය විය.**

**මුදල් වංචාව සහ බොරු ලියවිලි ඉදිරිපත් කිරීම පිළිබඳව තිදෙනෙකුට දඬුවම් පමුණුවනු ලැබුවද චෝදනා ලැබ සිටි එම සමාගමේ විධායක නිලධාරීන් හය දෙනෙකුට විරුද්ධව එල්ලකර තිබූ චෝදනා බොහොමයකින් ඔවුහු නිදහස්වූහ. කරන ලද ගෙවීම් අල්ලස් යැයි පිළිගැනීමට තරම් සාක්කි නොතිබුණු බව උසාවිය ප්‍රකාශ කෙළේය.**

**දඬුවම් ලැබූ එක් නිලධාරියෙකු ඉන්පසු ඔලිම්පික් මාධ්‍යවේදීන්ගේ සංගමයට තේරී පත්වී සිටී.**

### අනුග්‍රහය

විවිධ ක්‍රීඩාවන්ට සහ කණ්ඩායම් වලට අනුග්‍රහය දක්වනු ලබන්නේ ප්‍රචාරක හා වෙනත් පහසුකම් ලබාගැනීමේ කොන්දේසි මතය. විශේෂ අමුත්තන් සඳහා ප්‍රවේශ පත් නියමිත ප්‍රමාණයක් ලබාගැනීම එවන් පහසුකම් අතර වෙයි. අනුග්‍රාහකයින් වශයෙන් තමන් වැයකරන මුදල් ප්‍රමාණය ගැන හෝ ප්‍රවේශ පත්‍ර ලබාදෙන දේශපානඥයින් සහ වෙනත් පුද්ගලයින් කවුරුන්ද යන්න වග ප්‍රකාශයට පත්කිරීමට අනුග්‍රාහී සමාගම් මැලිය. එවන් ගණුදෙනු විනිවිදබවින් තොරය. සමාගම් විසින් මෙම ක්‍රියාවන් පසුව තමන්ට වාසි ඇතිවන අයුරු රජයන්ට සහ දේශපානඥයින්ට බලපෑම් කිරීමට යොදගතහැකිය.

### මාධ්‍යය

ක්‍රීඩා මාධ්‍යවේදීන් මෙන්ම පුවත්පත් සහ රූපවාහිණී ආයතන ක්‍රීඩා සමාජ, තරග සංවිධායකයින් හෝ ක්‍රීඩා සංගම් සමග දූෂණ ක්‍රියාවන්ට තුඩුදිය හැකි අන්දමේ සම්බන්ධතා පවත්වති. මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීබව ක්‍රීඩාවේ දූෂණය හෙළිදරව් කිරීමට අත්‍යාවශ්‍යය. කෙසේවුවද, මාධ්‍යවේදීන්ට ක්‍රීඩා ඉසව්වක් වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීමේදී හෝ පුවත් පත් නිවේදන හෝ විශේෂාංග සකස්කිරීමේදී පක්ෂපාතී බවක් දැක්වීමට පුළුවන. ක්‍රීඩාවේ විනිවිද බවක් නොමැතිකම නිසා මාධ්‍ය සහ ක්‍රීඩාවන් අතර ඇති සමීප සම්බන්ධකම් හේතුවෙන් නොයෙකුත් අන්දමේ අයුතු ක්‍රියාවන්ට මග පෑදේ. බොහෝ රටවල ජාතික මට්ටමේ වැදගත් ක්‍රීඩා තරග පෞද්ගලික රූපවාහිණී ආයතන වලට විකිණීමේදී එතරම් විනිවිද බවක් පෙනෙන්නට නැත. අයිතීන් විකිණීමෙන් ක්‍රීඩා සංගම්වලට විශාල මුදල් ලැබෙන බව සැබෑය. එහෙත් ඒ දූෂණය සහ වෙනත් අනිසි ක්‍රියා මධ්‍යයේ සිදුවන බවට සැක මතු කරමිනි.

## 2 දූෂණ විරෝධි ක්‍රියාවන් ක්‍රීඩාවට අනුකූලනය කිරීම

විනිවිදබව සහ සුපිලිපන්බව ප්‍රවර්ධනය කරමින් දූෂණ විරෝධි වැඩ පිළිවෙලක් ලෝකය පුරා ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ක්‍රීඩා ක්ෂේත්‍රය ගැන විශේෂ අවධානයක් යොමු නොවීය.

ක්‍රීඩාව ජාත්‍යන්තර මෙන්ම ජාතික මට්ටමින් විශාල ප්‍රචාරයක් ලබයි. මේ හේතුවෙන් දූෂණ විරෝධී වැඩ පිළිවෙල නිසියාකාරව ක්‍රියාත්මක නොකළහොත් එයින් අවැඩක් සිදුවන්නට ඉඩ තිබේ. ක්‍රීඩා ක්ෂේත්‍රයේ දූෂණය පැතිරෙන බව මහජනයාට පෙනීගියහොත් දූෂණය පවත්නා සෙසු ක්ෂේත්‍රවලද ඒ තත්ත්වය වෙනස්කිරීම ගැන ඔවුන් උනන්දුවක් නොදැක්වීමට ඉඩ ඇත. දූෂණය හේතුවෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයට සිදුවිය හැකි හානිය දැක එම ගැටලු නිරාකරණය කර ගැනීමට තැත්කිරීම එදිනෙද ජීවිතයේ දක්නට ලැබෙන දූෂණ ක්‍රියා මැඩලීමට දිරිගැන්වීමක් වනු ඇත.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ දූෂණය ගැන සලකාබලද්දී විවිධ රජයන් හැසිරෙන ආකාරයද සැලකිල්ලට ගත යුතුය. බොහෝ ආණ්ඩු සිය බලපුළුවන්කාරකම දැක්වීමට ක්‍රීඩකයින්ගේ දක්ෂතාවය සහ තමන්ගේ රටවල් ජාත්‍යන්තර තරග වලදී ලබන ප්‍රතිඵල යොදගැනීමට තැත්කරති. විශේෂයෙන්ම විනිවිදබව සහ වගවීම අතින් දුර්වල රටවල් මෙසේ ක්‍රියාකරමින් තම රටවලට ජාත්‍යන්තර තලයේ තැනක් ලබාගැනීමට උත්සාහ දරති. ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධාන මෙම ගෝලීය ආකර්ශනය යොදගනිමින් දියුණු වෙන රටවල ක්‍රීඩා කණ්ඩායම් සහ යටිතල පහසුකම් දියුණු කිරීමට උනන්දු වෙති. කෙසේවුවද, මෙය විනිවිද අයුරින් සිදුවිය යුතුය. එසේ නොවුවහොත් දූෂණයට දොර ඇරේ.

ක්‍රීඩා සමාජ සහ කණ්ඩායම් වල ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය ඒවායේ විනිවිදභාවය, වගවීම සහ සුපිලිපන්භාවයේ අඩුපාඩු වලට වගකිවයුතුද යන්න ගැන සොයාබැලීමද දූෂණ විරෝධී වැඩ සටහනට අයත් තවත් කාර්යයකි. ස්වයං පාලනය හේතුවෙන් ජාතික ක්‍රීඩා සංවිධාන දේශපාලනමය වශයෙන් අනිසි ලෙස යොදගැනීම වළක්වයි. එසේවුවද ඒ මගින් තීරණ ගන්නා ක්‍රියාමාර්ගයේදී වගවීම පිළිබඳව උනන්දුවක් නොදැක්වීමට පුළුවන. බොහෝ රටවල ක්‍රීඩාවලට රජය මාර්ගයෙන් විශාල වශයෙන් මහජන මුදල් දෙනු ලැබේ. එහෙත් අධීක්ෂණයක් නොමැතිනම් ආර්ථිකයේ වැදගත් කොටසක් මෙන්ම මහජන මුදල් යෙදගන්නා ආකාරය ප්‍රමාණවත් තරමට හෙළි නොකෙරෙනවා මෙන්ම බොහෝවිට ප්‍රමාණවත් අන්දමින් පාලනය නොකෙරේ.

### ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනවල මග පෙන්වීම

**ආජෙන්ටිනාව: ක්‍රීඩා ක්ෂේත්‍රයේ විනිවිදබවින් සහ වගවීමෙන්යුත් පරිපාලනයකට හා නායකත්වයකට අවශ්‍ය උපදේශ මාලාවක් පිලියෙල කර ඇත. අධ්‍යක්ෂවරුන් නිතිපතා සිය වත්කම් හෙළිකිරීම, අය වැය පළකිරීම හ විවිධ දේ මිලදී ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් ඊට අයත්ය.**

**ඉතාලිය: වැඩි අවධානය යොමුවී ඇත්තේ අධ්‍යාපනය සහ පාසැල් සම්බන්ධයෙනි. වට මේස සාකච්ඡා මගින් රජයේ නිලධාරීන්, සිවිල් සමාජ සංවිධාන සහ මළල ක්‍රීඩකයින් එක් රැස්කර ආචාරධර්ම සහ සුපිලිපන්බව වැඩිදියුණු කිරීම පිළිබඳව කතා බස් කෙරේ.**

**කෙන්යාව: කෙන්යාවේ පාපන්දු සම්මේලනයේ ඡන්ද විමසීම් ක්‍රියා පිළිවෙත් විවිධ දූෂණ චෝදනා මත බිඳ වැටුණු අවස්ථාවේදී තීරක ලෙස ඉදිරිපත්වූයේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයයි. විනිවිදබව ගොඩනැගීමේ පියවරක් වශයෙන් කණ්ඩායම් සමග තරග සංවිධානය කෙරුණි.**

**ස්විට්සර්ලන්තය: මාධ්‍යයේ ලිපි පළකිරීමෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දූෂණ පිළිබඳ අවධානය යොමුකෙරේ. ක්‍රීඩා සංගම්වල තීරකයින් සහ නායකයින් සහ මාධ්‍යය අතර වට මේස සාකච්ඡා සංවිධානය කෙරේ.**

විවිධ රටවල ඇති ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතන ඒ ඒ රටවල ආණ්ඩු සහ සංගම් සමග ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිදුවන දූෂණ පිළිබඳව කටුයතුකිරීමට පටන් ගෙන ඇත. එයින් බලාපොරොත්තුවන්නේ විනිවිදබව, වගවීම සහ සුපිලිපන්බව ශක්තිමත් කිරීම සඳහා පියවර ගැනීමය.

## 3 වෙනස්කම් ඇතිකිරීම: අභියෝග සහ අවස්ථා

ක්‍රීඩා ක්ෂේත්‍රයේ දූෂණ මැඩලීමේ වැඩ පිළිවෙල ඉදිරියට ගෙනයා හැක්කේ ක්‍රීඩා භාර බලධාරීන්, කණ්ඩායම් අයිතිකරුවන්, විවිධ කටයුතු සඳහා අයිතිය ලබාගන්නවුන්, අනුග්‍රාහකයින් සහ ක්‍රීඩාවට සම්බන්ධ වෙනත් අය විනිවිදබව, වගවීම සහ සුපිළිපන්බව ශක්තිමත් කිරීම මුල්කරගෙන ක්‍රියාකිරීමට ශක්තිය ඇත්නම් පමණය.
විධිමත් ක්‍රියාමාර්ගයක් සඳහා දූෂණ ක්‍රියාවන් වලට තුඩුදෙන අංශ හඳුනාගෙන දූෂණ විරෝධී වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා යොදාගත හැකි පිළිවෙත් ගැන අවබෝධයක් පහත පළවෙන යෝජනා වලින් ලබාගත හැක.

### තරග පාවාදීම වැලැක්වීම

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය සකස් කර ඇති අල්ලස් මැඩලීමේ ව්‍යාපාරික ප්‍රතිපත්ති වැනි දූෂණ විරෝධී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ අනිසි ක්‍රියාවන් සහ දූෂණය වැලැක්වීම සඳහා ජාත්‍යන්තර සූදු සංවිධානය සමග එක්ව කටයුතු කිරීම.

### සංවිධානාත්මක අපරාධ වැලැක්වීම

අන්තර්ජාතික සංවිධාන මෙන්ම ජාතික සහ කලාපීය මට්ටමේ දූෂණ විරෝධී, වංචා විරෝධී සංවිධාන සමග හවුල්ව කටයුතු කිරීම.

### ක්‍රීඩාව හා යහ පාලනය

වගවීම වැඩිකරන කටයුතු වල නිරතවීම පිණිස සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රීඩා සංගම් මෙන්ම ක්‍රීඩා සහ කණ්ඩායම්ද හවුල්ව කටයුතු කිරීම.

ක්‍රීඩාවලින් ලැබෙන ගුණාංගයන් ප්‍රගුණ කිරීමත්, ඒවා විශේෂයෙන්ම තරුණ ක්‍රීඩකයින් අතර ප්‍රචලිත කිරීම.

ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානවල ප්‍රඥප්ති, ව්‍යවස්ථා, සහ ආචාර පද්ධති වලට දූෂණ විරෝධී ප්‍රවිශයන් ඇතුලිකිරීම.

කණ්ඩායම් සහ සමාජ අයිතිකරුවන් අතර උද්යෝගය සහ විනිවිදබව ප්‍රවර්ධනය කිරීම.

### මාරුවීම

ක්‍රීඩක මාරුවීම් සහ සේවා නියුක්තියේදී පැහැදිලි රෙගුලාසි සහ විනිවිදබව ප්‍රවර්ධනය කිරීම.

**ඉදිකිරීම්**

විශාල ඉදිකිරීම් සඳහා සුපිලිපන් ගිවිසුම් සහ ඒවා නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයන් යොදාගැනීම.

විශාල ක්‍රීඩා තරග පැවැත්වීමට නගර සහ ආගන්තුක රටවල් තෝරාගැනීම ඇතුළු එවන් වෙනත් ගිවිසුම් ඇතිකරගත යුතු  කාර්යයන් සඳහා 'ලංසු සුපිලිපන් ගිවිසුම්' ඇතිකරගැනීම. නිදසුනක් ලෙස පාපන්දු ලෝක කුසලාන 2018 සහ 2022 පැවැත්වෙන ස්ථානය තෝරාගනු ලබන්නේ 2010 දෙසැම්බර් මාසයේදීය. එවිට යෝජිත ක්‍රියාමාර්ගය අනුගමනය කළ හැක.

රජය යොදවන අරමුදල් පරීක්ෂණය සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ ප්‍රධාන තරග සඳහා මූලික කටයුතු පිළියෙල කරද්දී ඒවායේ සඵලතාව ගැන වගබලා ගැනීම. විශේෂයෙන්ම ගොඩනැගිලි ඉදිකිරීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ මුදල් පරිහරණය පිළිබඳව විමසලිමත්වීම.

**අනුග්‍රහය**

දේශපාලනය සහ ක්‍රීඩා සංවිධාන අතර කිට්ටු සබඳකම් පවත්වාගැනීම දූෂණ ක්‍රියාවන්ට තුඩුදිය හැකි ක්‍රීඩා සංගම්, කණ්ඩායම්, පුහුණුකරුවන්, ක්‍රීඩකයින් සහ පුරවැසියන් දැනුවත්කිරීම.

විශේෂ අමුත්තන්ට ආරාධනා කිරීම, ප්‍රවේශ පත්‍ර බෙදහැරීම සහ ක්‍රීඩා තරග සඳහා අයිතිය ලබාදීම සම්බන්ධයෙන් ආචාර ධර්ම පද්ධතියක් සහ නීති රීති පිළියෙල කිරීම.

ක්‍රීඩාවේ ආචාර ධර්ම රැකීම අනුග්‍රාහකයින්ගේ ආයතනික වගකීමක් වශයෙන් ඇතුලත් කිරීම.

**මාධ්‍යය**

ක්‍රීඩා ක්ෂේත්‍රයේ ආචාර ධර්ම විරෝධී ක්‍රියාවන් සහ දූෂණයට එරෙහිව ක්‍රියාකිරීමට මාධ්‍යට පැවරෙන වැදගත් කාර්යය පිළිබඳවත්, මාධ්‍ය නිදහස නැතිවීමෙන් සිදුවිය හැකි හානි පිළිබඳවත් මාධ්‍යය දැනුවත් කිරීම.

ක්‍රීඩා ක්ෂේත්‍රයේ දූෂණ සහ මාධ්‍යයේ විනිවිදබව ඇතිකම හෝ නැතිකම පිළිබඳව සැලකිල්ල යොමුකිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන සහ මාධ්‍යවේදීන් අතර සබඳකම් ගොඩනගා ගැනීම. ක්‍රීඩා තරග සඳහා රූපවාහිනී අයිතීන් විකිණීම එක් නිදසුනකි.

References:
1 See: Max Bloom, “Streaming the 2008 Olympics”, Streaming Media, 13 June 2008.
www.streamingmedia.com/article.asp?id=10405.
2 See: Conclusion of the Austrian EU-Presidency, 29-30 March 2006. Sports and the economy in Europe.
www.idrett.no/t2.aspx?p=68704&x=1&a=166927.
3 Christian Helmenstein, SportsEconAustria, ‘Sports and Economics in Europe: A Tour d’Horizon’, presentation.
Vienna, 29 March 2008.
4 By law, 25 per cent of the lottery funds goes to sports. See: Veikkaus, ‘Veikkaus’ Year 2008: Corporate Responsibility
Annual Report’ (Helsinki, Finland: Veikkaus, 2009). www.veikkaus.fi/info/yritys/pdf/vuosiraportti_e_08.pdf.
5 See: TI’s Corruption Perceptions Index (CPI). Accessed online 26 August 2009.
www.transparency.org/news_room/in_focus/2008/cpi2008/cpi_2008_table.
6 See: Angus Wright, “Wdowczyk held over match-fixing allegations”, The Scotsman, 29 March 2008.
7 See: Associated Press, “Ref detained in Polish soccer match-fixing probe’, Edmonton Sun, 13 August 2009.
www.edmontonsun.com/sports/soccer/2009/08/13/10448866.html.
8 “Poland’s right to host Euro 2012 in doubt as dispute with Fifa remains deadlocked”, The Telegraph, 6 October 2009
9 See: European Handball Federation, “EHF Arbitration Tribunal takes final decision in prominent case”, EFH Official
Statement, 31 July 2009. www.eurohandball.com/article/012472.
10 See: “Two officials detained in Polish soccer corruption probe”. The Canadian Press, 28 July 2009.
11 See: Luke Harding, “Two years in jail for match-fixing German referee”, The Guardian, 18 November 2005.
www.guardian.co.uk/football/2005/nov/18/newsstory.sport4.
12 Countries include Austria, Belgium, Finland, Germany, Italy, Kenya, Portugal, Singapore and Viet Nam. See: Kasper
Lindberg, “How to Fix a Football Match”, Play the Game Magazine. Online.
www.playthegame.org/upload/Magazine%202005/howtofixamatch.pdf.
13 See: FATF, ‘Money Laundering through the Football Sector’ (Paris, France: FATF, July 2009). www.fatfgafi.
org/dataoecd/7/41/43216572.pdf.
14 Global figures are for 2006 and from: Global Betting and Gaming Consultants, ‘Quarterly eGaming Statistics Report
– May 2007’ (London: GBGC, 2007). See: www.antiguawto.com/WTO_Economic_gambling_data.html and
www.gbgc.com. Figures from Nevada are from 2006. See: David G. Schwartz, ‘2006 State wide Nevada Gaming Win,
All Non-restricted Locations’. http://gaming.unlv.edu/media/2006_NV_gaming.pdf.
15 According to the report, completed questionnaires were received from 25 countries although 22 nations are listed:
Argentina, Australia, Belgium, Brazil, Canada, Chile, Colombia, Ecuador, France, Italy, Japan, Latvia, Lithuania,
Luxembourg, Mexico, Netherlands, Portugal, Romania, Singapore, Sweden, Switzerland and the United Kingdom.
16 See (in Danish): Nilas Heinskou, ”DBU får skarp kritik for lukkethed om aftalt spil”, Politiken, 7 April 2009.
http://politiken.dk/sport/fodbold/article685714.ece. The results are based on a questionnaire sent to 120 clubs and
which collected 81 responses from coaches, team heads, players, club directors and club presidents.
17 See: Martyn Ziegler, “Investigation over Fifa ‘vote-buying’ claim”, The Independent, 16 April 2009.
www.independent.co.uk/sport/football/news-and-comment/investigation-over-fifa-votebuying-claim-1669214.html.
18 See: European Commission, ‘The citizens of the European Union and Sport’, Special Eurobarometer 213/Wave 62.0
– TNS Opinion (Brussels: Eurobarometer, 2004).
19 See: James Pearce, “Transfer embargo hope for Chelsea”, BBC, 5 September 2009.
http://news.bbc.co.uk/sport2/hi/football/teams/c/chelsea/8239141.stm; Tom Fordyce, “Transfer corruption ‘rife’”, BBC.
30 January 2004. http://news.bbc.co.uk/sport2/hi/football/3444871.stm.
20 See: Associated Press, “FIFA cracks down on corruption in player transfers”, CBC, 14 July 2009.
www.cbc.ca/sports/soccer/story/2009/07/14/sp-fifa.html.
21 See (in German): Simon Rosner, “Zeugin der eigenen Anklage“, Wiener Zeitung, 7 April 2009.
www.wienerzeitung.at/DesktopDefault.aspx?TabID=4913&Alias=sport&cob=407203&Page16277=4. See: “Lisa
Hütthaler muss vor Gericht“, Kurier, 20 May 2009. http://kurier.at/sportundmotor/320259.php. Also see: Thomas
Hochwarter, “Another positive test worsens Austrian doping scandal”, The Austrian Times, 7 April 2009.
www.austriantimes.at/news/Sports/2009-04-07/12340/Another_positive_test_worsens_Austrian_doping_scandal.
22 See: “WADA labs corrupted, claims cyclist Kohl”, AFP, 14 August 2009.
http://news.yahoo.com/s/afp/20090814/sp_wl_afp/cyclingtriathlonautwadadoping.
23 See: “PM to investigate fraud in Liberec ski championship”, CzechNews, 20 February 2009.
http://aktualne.centrum.cz/czechnews/clanek.phtml?id=630118.
24 This is the smallest of all sectors funded by the government (2006/2007). See: www.srsa.gov.za/ClientFiles/p12-
13%20Sports%20budget.pdf.
25 See: “World Cup whistleblower shot dead in South Africa”, The Telegraph, 5 January 2009.
Www.telegraph.co.uk/news/worldnews/africaandindianocean/southafrica/4125815/World-Cup-whistleblower-shot-deadin-
South-Africa.html.
26 See: “Austrians back out of Lviv Euro 2012 stadium project”, The Kyiv Post, 22 October 2008.
www.kyivpost.com/business/bus_general/30542/print. Also see: “New blow to Ukraine 2012”, Sky Sports, 16 October
2008. www.skysports.com/football/euro2008/story/0,23063,13953_4344295,00.html
27 See: Fred Weir, “Putin faces green Olympic challenge”, The Christian Science Monitor, 10 July 2008. Also see: Boris
Nemtsov, ‘Sochi’s Olympic Troubles’, The Washington Post, 25 April 2009.
28 See: US Legal Definitions. Website. Accessed 19 August 2009. http://definitions.uslegal.com/c/corporatesponsorship/.
29 See: Radim Bures, ‘Why Sport is not Immune from Corruption’ Prepared by TI Czech Republic (Strasbourg:
Enlarged Partial Agreement on Sport, 1 December 2008)
www.coe.int/t/dg4/epas/Source/Ressources/EPAS_INFO_Bures_en.pdf.
30 See: Kirsten Sparre, “Only minor convictions in corruption case against ISL executives”, PlaytheGame.com, 9 July
2008. www.playthegame.org/news/detailed/only-minor-convictions-in-corruption-case-against-isl-executives-1382.html.
31 See: “Report accuses leading Fifa official of taking bribes”, The Guardian, 26 September 2006.
www.guardian.co.uk/football/2006/sep/26/newsstory.sport.
32 See: Poder Ciudadano,’Algunos requisitos mínimos para promover la transparencia en la gestión de entidades
deportivas’ (Buenos Aires: Poder Ciudadano, December 2007).
33 See: TI, “Kenyan football: time for a sporting chance” p.76, in Global Corruption Report 2001 (Berlin: TI, 2001).